මාවනැල්ල ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනෙහි 2018 දෙසැම්බර් 31 දිනට ණය හිමි ශේෂය රු. 5,967,872 ක් වුවද, මූල්‍ය ප්‍රකාශවල රු .5,697,872 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. | අතපසුවීමක් සිදු වී ඇති බැවින් . 2019 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරමි. |
| (ii) | ණයහිමියන් යටතේ දක්වා තිබුණු ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවිය යුතු රු. 11,902,981 ක් නොගෙවන ලෙස 2008 හා 2013 වර්ෂවලදී අධිකරණය තීන්දුකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි. | අදාල ගැලපීම් කර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී එය නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2015 වර්ෂයේ මුද්දර ගාස්තු උපලේඛන සකස් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු. 139,200 ක් වැය ශීර්ෂයන්ට හර කර තිබුණු අතර 2016 වර්ෂයට අදාලව ගෙවිය යුතු රු. 53,500 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුවේ. | මෙවැනි අතපසුවීම් ඉදිරියේදී සිදු නොකිරීමට හා 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් රු. 587,289 ක් වටිනා පස්තැලීමේ උපකරණය ගිණුම්ගතකර නොතිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කර ගනිමි. |

(ඇ) නොසැසඳීම්

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන ශේෂ හා උපයෝගී ලේඛන/ වාර්තා ශේෂ අතර රු. 279,569 ක වෙනසක් විය. | ශේෂ සසඳා නිවැරදි කර ගත යුතුවේ. | සේවක ණය නිවැරදි කිරීමට කටයුතු කරන අතර සතිපොළ ගාස්තු නිරවුල් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු නොමැත. පුස්තකාල පොත් ශේෂයේ සහ ආයුර්වේද ඖෂධ තොග ශේෂයේ ගණිතමය දෝෂයකින් වරදක් සිදුවි ඇත. |

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | 2003 වර්ෂයේ සිට පැවත එන රු. 152,140 ක වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | දීර්ඝ කාලයක සිට පැවත එන ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ පිළිබඳව ප්‍රධාන අමාත්‍යාංශය විමසා මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයක් ඉක්ම වූ ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 59,110,826 ක් විය. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ආදායම් අයකර ගැනීමට ආදායම් අංශය සමඟ එක් වී ඉදිරි කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයක් ඉක්ම වූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ | 2019 වර්ෂයේ මහා සභාවට යොමු කොට තීරණයන් ලබාගෙන ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

එකතු වටිනාකම යුතුවේ.
රු. 18,793,555 ක් විය.

1.4 අනුකූල නොවීම

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 33 | වරිපනම් බදු හා අක්කර බදු අයකිරීමට සහාව කටයුතු නොකිරීම නිසා 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.8,670,894 ක්වූ හිඟ වරිපනම් බදු ශේෂය තුල වර්ෂයකට වඩා පැරණි රු. 2,784,879 ක ශේෂයන් විය. | හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | සෑම කාර්තුවකම නියමිත සැලැස්මක් අනුව දේපල තහනම් කිරීමේ කටයුතු සිදු කර ඇත. එසේම වර්ෂය මුල වරිපනම් බදු ගෙවීමට කටයුතු කිරීමෙන් වට්ටම් ලබාගැනිම පිළිබඳව හා ගෙවීම් ප්‍රමාදයක් සිදුවීමේදී දඩ මුදල් ගෙවීමට සිදු වීම පිළිබඳවත්, නීති ප්‍රකාරව දේපල තහනම් කිරීම ආදී කරුණු පිළිබඳවත් , ජනතාව දැනුවත් කිරීම් නිරන්තර සිදු කෙරේ. |
| (ආ) | 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් මඟින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | වලංගු කාලය වර්ෂ 3 ඉක්මවූ ව්‍යාපාර ආයතන 34 කට පරිසර බලපත්‍ර නිකුත් නොකිරීම නිසා රු.136,000 ක් අය කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | මේ පිළිබඳව තොරතුරු සොයා අවශ්‍ය කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (i) මුදල් රෙගුලාසි 571(2) | 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල රු.2,379,682 ක් වූ තැන්පත් 150 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | කල් ඉකුත් වූ තැන්පත් නැවත ලබා ගන්නා ලෙස 2019 මාර්තු 13 දින පුවත්පත් දැන්වීමක් මගින් ජනතාව දැනුවත් කොට ඇත. එසේ නමුත් කිසිදු පුද්ගලයෙක් ඒ සඳහා ඉදිරිපත් නොවුනු බැවින් අදාල මුදල ආදායමට ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 571 (3) | 2014 සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළ බාහිර පාර්ශවයන්ට ප්‍රේෂණය කළ යුතු එකතුව රු. 547,843 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කළයුතුවේ. | දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට රු. 1,175 ක් යැවීම සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇත. සේවක අර්ථ සාධක අරමුදලින් එවා ඇති රු. 538,876 ක් විශ්‍රාම වැටුප් වැන්දඹු අනත්දරු ගිණුමට යොමු කිරීම සඳහා රඳවා තබා ඇත. |
| | (iii) මුදල් රෙගුලාසි 1646 | සභාවේ වාහන 23 කට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | වසර ගණනාවක සිට නියමිත පරිදි ධාවන සටහන් ඉදිරිපත් කර නොමැත. මෙම වර්ෂයේ ජනවාරි මාසයේ සිට සියලු වාහන වල මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාවේ වාහන 8 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි . | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා මේ වන විටත් වැඩ පිළිවෙලක් සකස් කර ඇත. |
| (ඉ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 02 ඡේදය | 2009 වර්ෂයෙන් පසු වරිපනම් තක්සේරුවක් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | නව තක්සේරුවක් සිදු කර ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරීමට නියමිතව ඇත. |
| (ඊ) | 2009 මාර්තු 09 දිනැති අංක 01/2009 දරන සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 1.11 ඡේදය | කඩ කාමර අතුරු බදු දීමේදී මුලින් අයකළ එක්වන් මුදලින් සියයට විසිපහක ගාස්තුවක් අතුරු බදුකරුගෙන් අයකළ යුතු වුවත් කඩ කාමර 43 කින් එකී ගාස්තු අය කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුනු පසු කඩකාමර සඳහා මුල් අවස්ථාවේදී අයකරන ලද කීමනී මුදලින් 25% අයකර ගැනීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 44,599,893 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 47,963,859 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. '000 | බිල්කල ආදායම රු'.000 | රැස්කල ආදායම රු. '000 | දෙසැම්බර් 31දිනට මුළු හිඟය රු. '000 | ඇස්තමේන්තුගත ආදායම රු. '000 | බිල්කල ආදායම රු. '000 | රැස්කල ආදායම රු. '000 | දෙසැම්බර් 31දිනට මුළු හිඟය රු. '000 |
| වරිපනම් හා බදු | 15,609 | 11,201 | 13,115 | 8,671 | 15,304 | 11,760 | 13,948 | 10,055 |
| කුලී | 32,307 | 26,773 | 25,194 | 5,156 | 27,859 | 26,397 | 23,144 | 3,575 |
| බලපත්‍ර ගාස්තු | 3,400 | 682 | 682 | - | 2,675 | 2,350 | 2,718 | - |
| වෙනත් ආදායම් | 129,005 | 143,029 | 118,530 | 93,067 | 108,712 | 93,200 | 52,868 | 102,553 |

#### 2.2.2. කුලී

----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| වර්ෂයක කාලයක් ඉක්මවූ හිඟ කඩ කාමර කුලී රු. 3,307,536 ක් තුල හිඟුල වෙළඳ සංකීර්ණයේ 1999 සිට 2014 දක්වා කඩ කාමර 25 ක් වෙනුවෙන් ලැබියයුතු එක්වන් මුදල් රු. 50,350 ක් හා හෙම්මාතගම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 07 ක් වෙනුවෙන් ලැබියයුතු වර්ෂයක කාලයක් ඉක්මවූ කඩ කුලී රු. 1,607,775 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | හිඟුල වෙළඳ සංකීර්ණයේ තවදුරටත් රු.50,350 ක් අයවීමට ඇති අතර හෙම්මාතගම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් නවතා ඇති බැවින් කී මනි ද එකතුකර ගැනිමට නොහැකි වී ඇත. මේ පිළිබඳ මහා සභාව දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කරමි. |

2.2.3 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| වර්ෂයක කාලයක් ඉක්මවූ වෙනත් ආදායම් හිඟ ශේෂය රු. 2,308,318 ක් වූ අතර සමාලෝචිත වර්ෂයට අදාලව ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු 16 කින් රු. 344,240 ක් හා තාවකාලික දැන්වීම් පුවරු 15 කින් රු. 10,800 ක් අයකර නොතිබුණි. | ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | හිඟ දැන්වීම් පුවරු ගාස්තු අයකිරීමට නීත්‍යානුකූල කටයුතු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් සකස් කර අනුමැතියට යොමු කර ඇති අතර තාවකාලික දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකර ගැනීමට නීතක්‍යානුකූල ක්‍රමයක් නොමැති බැවින් අදාල දැන්වීම් පුවරු 2019 ජනවාරි 23 වන දින ගලවා ඉවත් කර ඇත. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 8,412,870 ක් හා මුද්දර ගාස්තු රු.76,781,068 ක් වූ අතර වසරක් ඉක්මවූ ශේෂ පිළිවෙලින් රු. 4,501,875 ක් හා රු. 46,127,128 ක් විය. | ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 239,753 ක මුදලක් 2019 අප්‍රේල් 05 දින ලැබී ඇත. ඉතිරි මුදල්ද අයකර ගැනීම සඳහා පළාත් සභාව වෙත ලිඛිතව දන්වා යවා ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධන යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 04 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවද 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා දෙකක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අදාලවන පරිදි අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුවේ. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව වැළද ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| වාර්ෂික සැලැස්මේ දක්වා තිබුණු ක්‍රියාකාරකම් 06 ක් ඉටුකර නොතිබුණි. | සැලැස්මට අනුව කටයුතු කළයුතුවේ. | පිළිතුරු දී නැත. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ප්‍රාග්ධන වියදම් රු.13,558,532 ක් හා පුනරාවර්තන වියදම් රු.169,514,035 ක් දරා තිබුණු අතර උපයා තිබුණේ රු.2,415,786 ක ආදායමක් පමණි. | පරිසර හානිය අවම වන අයුරින් අපද්‍රව්‍ය කළමනාකරණය කර ආදායම් ඉපදවිය යුතුවේ. | එක් රැස්වන කසල වර්ගීකරණය කර දිරන ද්‍රව්‍ය කොම්පෝස්ට්කරණය තුළින් පොහොර අලෙවියෙන් යම් ආදායමක් ලබාගන්නා ලද අතර, නොදිරන අපද්‍රව්‍ය විකිණීමෙන්ද යම් ආදායම් ලබා ගැනීම සිදු කරනු ලැබේ. |

(ඇ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| ගලි අපද්‍රව්‍ය බැහැර කරලීම සඳහා සුදුසු ස්ථානයක් නොමැති වීම නිසා 2018 වර්ෂයේදී ගලි සේවය අත්හිටුවා තිබුණි. | සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන මහජන සේවාවන් ඉටු කල යුතුවේ. | ගලි අපද්‍රව්‍ය බැහැර කරලීම සඳහා මේ වන තෙක්ම සභාව සතුව සුදුසු ස්ථානයක් නොමැත. ගලි අපද්‍රව්‍ය විවෘත භූමියට බැහැර කිරීමෙන් පරිසරයට වන හානිය පිළිබඳව විගණනය විසින් පෙන්වා දීමෙන් අනතුරුව මේ වන විට ගලි අපද්‍රව්‍ය ලබා ගැනීමක් සිදු නොකෙරේ. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 වර්ෂයේ න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, එම අරමුණු ඉටුකර ගැනීම සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2019 පෙබරවාරි වනවිටත් සකස් කර නොතිබුණි. | දිගුකාලීන සැලසුම් සකස් කිරීමට කටයුතු කළයුතුවේ. | මේ සම්බන්ධයෙන් වන දිගුකාලීන සැලසුම් ඉදිරියේදී සකස් කිරීම යෝජිතව පවතී. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| (අ) අනුමත කාර්ය මණ්ඩලය 149 ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 117ක්වූ අතර තනතුරු වර්ග 17 ක පුරප්පාඩු 33 ක් හා එක් අතිරික්තයක් තිබුණි. මෙයට අමතරව අනියම් සේවකයන් 07ක් හා සේවා ගිවිසුම් මත 38 දෙනෙකු බඳවාගෙන තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතු අතර කාර්ය මණ්ඩල නිසි පරිදි කළමනාකරණය කරගත යුතුවේ. | නගරයට සංක්‍රමණය වන ජනගහනය අධික වීම හේතුවෙන් දෛනික වැටුප් පදනම මත සේවකයන් බඳවාගැනිමට සිදුවී ඇති නිසා තනතුරු ප්‍රමාණය වැඩිකර ගැනිමට පළාත් සභාවෙන් ඉල්ලීම් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගිනි නිවීමේ ඒකකයට අදාලව අනුමත තනතුරු 05 ක සේවක සංඛ්‍යාව 20 ක් වුවද, එක් තනතුරක් සඳහා අනියම් පදනමින් 07 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර ගිනි නිවීමේ සේවක ව්‍යවස්ථා සංග්‍රහය අනුව බඳවා ගැනීම් සිදුකර ගිනි නිවීමේ ඒකකය විධිමත් ලෙස ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිනි නිවීමේ ඒකකය විධිමත් ලෙස ස්ථාපිත කිරීමට කටයුතු කළයුතුවේ. | ගිනි නිවන ඒකකයේ තනතුරු සංඛ්‍යාව පළාත් සභාව මඟින් අනුමත කර එවා ඇති අතර ඔවුන් අන්තර්ග්‍රහණය කිරිම සඳහා අවශ්‍ය ඉල්ලුම් පත් නිර්දේශ කර පළාත් සභාවට ඉදිරිපත් කරමි. |
| (ඇ) | 2006 හා 2007 වර්ෂවල විශ්‍රාම ගිය හා සේවය අතහැරගිය සේවකයන් තුන් දෙනෙකුගෙන් අයවියයුතු ණය ශේෂය රු. 64,489 ක් විය. | අයවියයුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මුදල අයකර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරමි. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| මාවනැල්ල බස්නැවතුම්පල පොදු වැසිකිළියෙහි අපද්‍රව්‍ය සහිත ජලය පිටතට කාන්දුවීම නිසා 2014 වර්ෂයේ සිට වැසිකිළිය වසා ඇති බැවින් පොදු මහජනතාවට සේවා සැපයීමට නොහැකිවී තිබුණි. | මහජන අවශ්‍යතා සපුරාලීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නගර සංවර්ධන වැඩසටහන යටතේ මේ පිළිබඳව අවධානය යොමු කිරිමට නියමිතව ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 නිශ්ක්‍රිය/ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | වසර 01 සිට 09 දක්වා කාලයක් තුල අක්‍රියවී තිබුණු රු. 2,143,860 ක් වටිනා වාහන 04 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙනත් | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුවේ. | වාහන වෙන්දේසි කිරීම සඳහා ඉදිරියේදී කටයුතු සිදු කරමි. |

| | | | |
|---|---|---|---|
| | සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වී තිබුණි. | | |
| (ආ) | 2017 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරියෙන් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබූ බේල් යන්ත්‍රය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුවේ. | ඉදිරියේදි මේ පිළිබද කරුණු සොයා බලා කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

4.1 අයවැය පාලනය

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයයන් 39 ක රු. 44,909,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් හා වැය විෂයන් 20 ක රු. 23,342,965 ක ප්‍රතිපාදන වලින් සියයට 85 සියයට 99 අතර එකතුව රු.68,251,965 ක් උපයෝජනය කර නොතිබුණි. | වඩාත් ප්‍රායෝගික ලෙස අයවැය ඇස්තමේන්තු සකස්කළ යුතුවේ. | අභ්‍යන්තර පාලන ක්‍රම තුළින් වියදම් මනාව පාලනය කර ගැනීමට උත්සාහ කරමි. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට ක්‍රියාකළ යුතුය. | 2019 වර්ෂයේ මැයි මාසය තුළ විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම සඳහා කටයුතු කරන බව දන්වමි. |